# ජාඇල ප්‍රාදේශීය සභාව

# ගම්පහ දිස්ත්‍රික්කය

1. **මූල්‍ය ප්‍රකාශන**

1.1 **මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2012 මාර්තු 16 දින ද ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 2011 මාර්තු 29 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2013 පෙබරවාරි 05 දින සභාවේ සභාපතිවරයා වෙත යවන ලදී.

1.2 **මතය**

සභාපතිවරයා වෙත යවන ලද මාගේ වාර්තාවේ දක්වා ඇති අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් හේතුකොටගෙන විගණනය සඳහා ඉදිරිපත් කර ඇති ජාඇල ප්‍රාදේශීය සභාවේ 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට මට නොහැකිය.

1.3 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

1.3.1 **ගිණුම්කරණ ප්‍රතිපත්ති**

ගිණුම් පිළියෙල කිරීම සඳහා අනුගමනය කර ඇති ගිණුම් ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණි.

1.3.2 **ගිණුම්කරණ අඩුපාඩු**

(අ) මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන මුදල් ශේෂය රු.109,962,396 ක් වුවද, ප්‍රධාන මුදල් පොත අනුව ශේෂය රු.109,282,095 ක් වුයෙන් රු.680,301 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ආ) කර්මාන්ත සඳහා ගබඩාවෙන් නිකුත් කර තිබූ භාණ්ඩ/ ද්‍රව්‍ය වල වටිනාකම වූ රු.6,476,244 ක් පාග්ධන වත්කම් අලුත්වැඩියා ගිණුමට අයකර නැවතත් එම වටිනාකම එම ගිණුමේම බැරටද ගිණුම්ගතකර තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය තුළ දී දරන ලද වටිනාකම රු.1,817,145 ක් වූ ප්‍රාග්ධන වියදම් ගිණුම්ගත කර නොතිබුණි.

1.3.3 **විගණනය සඳහා සාක්ෂි නොවීම**

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.226,286,274 ක් වූ ගනුදෙනු ගිණුම් විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

1.3.4 **නොසැසඳුනු පාලන ගිණුම්**

ගිණුම් විෂයයන් 03කට අදාලව පාලන ගිණුම් අනුව ශේෂයන්ගේ එකතුව රු.59,194,758 ක් වූ අතර, උපයෝගී ලේඛන අනුව ගිණුම් ශේෂයන්ගේ එකතුව රු. 8,904,103 ක් විය.

1.3.5 **අවිනශ්චිත ගිණුම්**

වසර ගණනාවක සිට ඉදිරියට ගෙන එමින් තිබෙන අවිනිශ්චිත ගිණුම්වල 2011 දෙසැම්බර් 31 දිනට බැර ශේෂ එකතුව රු.236,425 ක් විය.

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ ආදායම ඉක්ම වූ පුනරාවර්තන වියදම රු. 51,052,758 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ආදායම ඉක්ම වූ පුනරාවර්තන වියදම රු. 51,258,757 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ .

| | ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟව |
|---|---|---|---|---|
| | | රු. 000 | රු. 000 | රු. 000 |
| i. | වරිපනම් බදු | 31,127 | 40,453 | 34,677 |
| ii. | බදු කුලී | 3,774 | 3,938 | 10,434 |
| iii. | බලපත්‍ර ගාස්තු | 2,679 | 2,937 | 115 |
| iv. | වෙනත් ආදායම් | 4,138 | 4,116 | 2,388 |

### 2.3. මෙහෙයුම් අකාර්යක්ෂමතා

(අ) 2011 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු සේවක ණය ශේෂය රු.12,428,410 ක්වූ අතර, ඒ තුළ අවුරුදු 01 ක කාලයක් ඉක්මවා අයවීම් හිඟහිටි ශේෂවල එකතුව රු.222,469 ක් විය.

(ආ) 2011 දෙසැම්බර් 31 දිනට සභාවේ බැංකු ජංගම ගිණුමේ රු.109,962,395 ක ශේෂයක් නිරීක්ෂණය වූ අතර, එකී බැංකු මුදල් කෙටි කාලීනව හෝ ආයෝජනය කිරීම කෙරෙහි සළකාබලා නොතිබුණි.

3. <u>පද්ධති හා පාලන</u>

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) අභ්‍යන්තර විගණනය

(ඇ) ආදායම් පරිපාලනය

(ඈ) වත්කම් කළමනාකරණය